INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

JDS
Journalists for Democracy in Sri Lanka

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

2020 දෙසැම්බර් 14

**ඒකාබද්ධ ප්‍රවෘත්ති නිවේදනය:** මාතලේ සිට මුල්ලිවයික්කාල් දක්වා - නොනවතින අපරාධ

**ජොහැන්නස්බර්ග්:** 1989 වසරේදී මාතලේදීත්, 2009 වසරේදී මුල්ලිවයික්කාල්හිදීත් සිංහල හා දෙමළ ජනයා සිය ගණනක් 'ආගිය අතක් නොමැති වූයේ' කෙසේදැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ හා ඔහුගේ හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා අධිකරණය හමුවේ පැහැදිලි කළ යුතුව තිබේ. ඔවුන්ගේ විධානය සහ පාලනය යටතේ සිදු වූ බලහත්කාරී අතුරුදහන් වීම් සම්බන්ධයෙන් ජාතික සහ ජාත්‍යන්තර නීතිය යටතේ ඔවුන් දෙදෙනාම සාපරාධී වගකීමට බැඳී සිටිති. 2009දී ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම් වශයෙන් කටයුතු කළේය; ප්‍රධාන සේනා විධායකයකු වූ ශවේන්ද්‍ර, බරපතල මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ විශ්වසනීය චෝදනා සම්බන්ධයෙන් එක්සත් ජනපද ආණ්ඩුව විසින් දැන් නම් කරනු ලැබ තිබේ.[1].

සමස්ත රටම ආණ්ඩුවේ පාලනය යටතේ පැවැති යුද්ධයේ අවසාන දවස්වලදී[2] දෙමළ ජාතිකයන් 330 දෙනකු 'ආගිය අතක් නොමැති බව' ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය[3] විසින් නොබෝදා නිකුත් කළ දත්ත මගින් පෙන්නුම් කර තිබේ. ගෝඨාභය රාජපක්ෂ දිස්ත්‍රික් හමුදා සම්බන්ධීකාරකයා වශයෙනුත්, ශවේන්ද්‍ර සිල්වා ඔහුගේ කණිෂ්ඨ නිලධාරියකු වශයෙනුත් ක්‍රියාකරමින් සිටි 1989 වසරේ අවසන් භාගයේදී මාතලේ දිස්ත්‍රික්කයේ සිංහල ජාතිකයන් 154 දෙනකු ද 'ආගිය අතක් නොමැති' සේ සැළකෙන බව ද මෙම දත්ත මගින් පෙන්නුම් කරයි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් දක්වන සංඛ්‍යාවන් අතිශයින් විශාල බව පිළිගන්නා නමුත් ඒවා බරපතල අවතක්සේරු තිරීම් බව ජාත්‍යන්තර සත්‍යය හා යුක්තිය පිළිබඳ ව්‍යාපෘතිය (ITJP) විශ්වාස කරයි.

*"සිය සමීපතමයන්ගේ ඉරණම හා ආගිය තැන් පිළිබඳ ඇත්ත දැනගැනීමේ අයිතියක් පවුල්වල සාමාජිකයන්ට ඇති අතර, බලහත්කාරී අතුරුදහන්කිරීම තවදුරටත් නොනැවතුණු අපරාධයක් වශයෙන් පවතින තත්ත්වයක් තුළ යටත් වූ දෙමළ ජාතිකයන් සිය ගණනක් 'ආගිය අතක් නැති වූයේ' කෙසේද යන්න පැහැදිලි කිරීමේ නීතිමය බැඳීමක් යටත්වූවන් භාරගත්, යුද්ධාවසානයේ වන්නියේ ආඥා වගකීම් දැරූ හමුදා නිලධාරීන්ට ඇතැ'යි ITJP සංවිධානයේ විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා ප්‍රකාශ කළාය.*

1 https://www.state.gov/public-designation-due-to-gross-violations-of-human-rights-of-shavendra-silva-of-sri-lanka-under-section-7031c-of-the-department-of-state-foreign-operations-and-related-programs-appropriations-a/
2 මැයි 16-20 කාලය තුළ ලියාපදිංචි සංඛ්‍යාවන් අප විසින් එකට එකතු කර තිබේ. මඩකළපු සංඛ්‍යාවන් නිකුත් කර නැති බව අවධානයට ගතයුතුය.
3 http://www.ompsrilanka.org/omp-documents/omp-publications

*"ඒ වගේම, තමන් මාතලේ ප්‍රදේශය භාරව කටයුතු කළ 1989දී ඒ සා සිංහල තරුණයන් ප්‍රමාණයක් ආගිය අතක් නොමැති වූයේ කෙසේදැයි ගෝඨාභය රාජපක්ෂ විසින් ශ්‍රී ලාංකීය මහජනයාට පැහැදිලි කර දෙනවාදැ"යි ඇය විමසා සිටියාය.*

*"යම් දවසක ඔවුන් සිය නිල තල අත්හළ දිනක ශ්‍රී ලංකාවේ හමුදාපතිවරයාට මෙන්ම ජනාධිපතිවරයාටත් එරෙහිව සිය ගණනක් අතුරුදහන්වීම් සම්බන්ධයෙන් අභිචෝදනා ගොණුකළ හැකි බව ආණ්ඩුවේ මෙම අතුරුදහන්වීම් පිළිබඳ නවතම ලැයිස්තුවලින් පෙන්නුම් කරතැ" යි ඇය තවදුරටත් කීය.*

***ආ ගිය අතක් නැතිද? අතුරුදහන්ද?***

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ප්‍රකාශයට පත්කර ඇති ලැයිස්තු මගින් ආගිය අතක් නොමැති වූවන් *(missing)* හා බලහත්කාරී අතුරුදහන්කිරීම්වලට පාත්‍රවූවන් *(enforced disappearances)* අතර පවතින නෛතික බෙදුම් රේඛාව බොඳ කරනු ලබයි. මෙමගින්, හමුදා අඩස්සියේදී අතුරුදහන් වූවන් සමග, ක්‍රියාන්විතයන්හිදි ආගිය අතක් නොමැති වූ සටන්කරුවන් හා 2009 අවසාන යුද්ධයේදී ෂෙල් ප්‍රහාර හා සම්බන්ධ සිදුවීම්වලින් මියගිය නමුත් බොහෝදුරට මෘතදේහ හඳුනාගත නොහැකි වූ ජනයා මිශ්‍රකොට තිබේ. මේ ආකාරයෙන්ම, මාතලේදී ද සිය ගණනක් තරුණ-තරුණියන් අවසාන වරට පොලිස් හෝ හමුදා අඩස්සියේ දුටු බව දැක්වෙන සවිස්තරාත්මක සාක්ෂි ප්‍රකාශ තිබේ. යුද්ධයකදී සෑම පුද්ගලයකුම අහිමිවීම ඛේදනීය කරුණක් වන නමුත් බලහත්කාරී අතුරුදහන්කිරීම් වූ කලී ජාත්‍යන්තර නීතිය යටතේ කාලසීමායන ව්‍යවස්ථාවක් *(statute of limitation)* නොමැති අඛණ්ඩව සිදුවෙමින් පවතින අපරාධයකි. ඊට එරෙහිව ඕනෑම වෙලාවකදී අභිචෝදනා ගොණුකළ හැකි අතර ප්‍රකාශයට පත්කර ඇති ලැයිස්තුවලින් මෙකී වැදගත් බෙදුම් රේඛාව නොපැහැදිලි කර තිබේ.

***අතුරුදහන් වූ ස්ථානය***

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ප්‍රකාශයට පත්කර ඇති ලැයිස්තු, යම් කෙනෙකු අතුරුදහන් වූ ස්ථානය ද නිරවද්‍යව නිශ්චිත කොට දක්වනු නොලබයි. මේ මගින් නිශ්චිත කාල වකවානු හා ස්ථානවල සිදු වූ පොකුරු අතුරුදහන්වීම්වලට වගකිව යුත්තන් හඳුනාගැනීමට උපකාරී විය හැකි රටාවන් නොපැහැදිලි කරයි[4].2009 මැයි මාසය වනවිට වන්නියේ සිටින්නට ඉඩ ඇති උතුරු - නැගෙනහිර පළාත්වල සියළුම දිස්ත්‍රික්කවලින් ආ දෙමළ ජනයා යුද්ධයේ අවසාන දිනවල අතුරුදහන් වූවා වියහැකි නමුත් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අදාළ අයගේ මුල් දිස්ත්‍රික්ක අනුව වගගත කර තිබීම හේතුවෙන් යුද්ධයේ අවසාන දිනවල ආගිය අතක් නොමැති හෝ අතුරුදහන් වූ සංඛ්‍යාවන් දුරවබෝධී කරයි.

***අවතක්සේරු කිරීම් හා වෙනත් ලැයිස්තු සමග සැසඳීම්***

උතුරු සහ නැගෙනහිරට අයත් දිස්ත්‍රික් සම්බන්ධයෙන් වන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ලැයිස්තු මගින් 2009 මැයි මාසයේ 16-20 අතර කාලය තුළ 335 දෙනකු[5] 'ආගිය අතක් නොමැති' බව පෙන්වා දෙයි. එයින් බහුතරයක් දෙනා වට්ටුවාකල් හෝ ඕමන්දෙහිදී අතුරුදහන්වූ අය වන්නට ඉඩ තිබේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් දක්වා ඇති සංඛ්‍යාවන්, එම කියන කාල වකවානුවේදීම ඕමන්දෙ හෝ වට්ටුවාකල්හිදී හමුදා අඩස්සියට පත්ව අවසාන වරට ජීවතුන් අතර සිටිනු දුටු 390 දෙනෙක් ඇතුළත්, 2018 වසරේදී ITJP සංවිධානය විසින් එක්රැස් කොට එහි වෙබ් අඩවිය[6] ඔස්සේ ප්‍රකාශයට පත්කළ සංඛ්‍යාවන්ට වඩා අඩු අගයක් ගනියි.

එමෙන්ම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් එළිදක්වා ඇති දත්තවලට, උදාහරණයක් වශයෙන් ජනතා විමුක්ති පෙරමුණේ දෙවැනි නැගිටීම සමයේ[7] මාතලේ දිස්ත්‍රික්කය තුළ 'ආ ගිය අතක් නොමැති' 235 දෙනකුගේ නම් ඇතුළත්ව ඇති අතර, මීට පෙර පත් කළ අතුරුදහන් වූවන් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිසම් සභාවන්ගේ දත්තවල මේ සංඛ්‍යාව මෙන් සිව් ගුණයක් - 1178ක් - [8] ඇතුළත්ව තිබූ බව සැළකිල්ලට ගැනීම වැදගත් ය. ඉකුත් තතිස්

---

[4] උදාහරණයක් වශයෙන්, යුද්ධාවසානයේ (මැයි 16-20, 2009) අතුරුහන් වූ කිලිනොච්චි දිස්ත්‍රික්කයට අයත් 95 දෙනකු කිලිනොච්චියේ ඔවුන්ගේ අවසානයට දැනසිටි ලිපිනයට අනුව ලියාපදිංචි කර තිබේ. මෙය අතාර්කික දෙයක් වන්නේ 2009 ජනවාරි මාසයේදී හමුදා පාලනයට යටත්ව තිබූ කිලිනොච්චියේ එම වසරේ මැයි මාසය වන විට ඔවුන් සිටියා වීමට ඉඩ නැති හෙයිනි. වඩා වියහැකි කරුණ වන්නේ, ඔවුන් ශ්‍රී ලංකා යුද හමුදාව විසින් යුද්ධයේ අවසාන දිනවල දී මුල්ලිවයික්කාල්හි බලහත්කාරී අතුරුදහන්වීම්වලට ලක්කළා විය හැකි බව ය.

[5] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබබඳ කාර්යාලය විසින් ප්‍රකාශයට පත් කර නැති මඩකළපු සංඛ්‍යාවන් මීට අයත් නොවේ.

[6] https://disappearance.itjpsl.com/#filter=date:16-052009&lang=english

[7] 1984 සිට 2016 දක්වා = නම් 289කි. නමුත් නම් 54ක් මේ කාල පරිච්ඡේදයෙන් නොවේ.

[8] මධ්‍යම කලාපය - මාතලේ දිස්ත්‍රික්කයේ තීන්දු නොකළ පැමිණිලි සංඛ්‍යාව 1042කි. නම් 136ක් ඇතුළත් වන්නේ විමර්ශනය කළ පැමිණිලි වලට ය.

වසර තුළ ඇතැම් පැමිණිලිකරුවන් වෙනත් දිස්ත්‍රික්කවලට මාරුවීමට හෝ මියගොස් තිබෙන්නට ඇති නමුත් මේ සා විශාල වෙනස්කමක් තිබීමට හේතු එම කරුණු විසින් පැහැදිලි නොකරයි. මෙහිදීද, අතුරුදහන් වූ ස්ථානය අනුව දත්ත දැක්වීමේත්, පූර්වයෙහි බලයේ සිටි ආණ්ඩු විසින් සම්පාදිත ලැයිස්තු සමග සැසඳීම් කිරීමේත් අවශ්‍යතාව මෙමගින් නැවතත් ඉස්මතු කොට පෙන්වයි.

*"මාතලේ සම්බන්ධයෙන් වන පාලනය කරන ලද සීමිත තොරතුරු වනාහී හුදෙක් හිමකුලක මුදුන පමණකැ'යි ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ මාධ්‍යවේදියෝ සංවිධානයේ භාෂණ අබේවර්ධන ප්‍රකාශ කළේය. "අතීත අපරාධවල සැබෑ පරිමාණය බොහෝදෙනා සිතනවාට වඩා අති විශාල එකකි. පසුකාලීනව තවත් කෲරකම් අධීක්ෂණය කළ බවට චෝදනා එල්ල වූ අතීත අපරාධවලට අදාළ චූදිතයන් මුළුමහත් දිවයිනේම පාලකයන් බවට පත්වීම විසින් පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාව තුළ දණ්ඩ මුක්තියේ සංස්කෘතිය කෙතරම් මුල්බැස ඇත්තේද යන්නයි."*

***තොරතුරු අතුරුදහන් වීම***

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ලැයිස්තුවල බලවත් මඟහැර යාම් තිබේ. ඔවුන්ගේ තොරතුරුවලට අනුව, 2009 යුද්ධයේ අවසාන දිනවල ත්‍රිකුණාමලයේ අතුරුදහන් සේ සැළකෙන කිසිවකු නොමැති අතර මෙය බොහොදුරට නොවිය හැක්කකි. සමස්ත යුද වකවානුව තුළම ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ අතුරුදහන්ව බවට ඔවුන් ලැයිස්තුගත කර ඇත්තේ 17 දෙනකු පමණි. අවශේෂ දිස්ත්‍රික්කවල ඇත්තේ නම් ස්වල්පයක් වන අතර බදුල්ලේ සංඛ්‍යාව හය දෙනෙකි. ඉදිරිපත්වීමට පවුල්වල ඇති නොකැමැත්ත මීට හේතුව විය හැකි නමුත් එය අවධානයට ලක්කිරීම වැදගත් වේ.

මානව හිමිකම් කණ්ඩායම් විසින් විශාල සිදුවීම් ගණනාවක් වාර්තා කර තිබියදීත්[9], 2008-9 කාලයට අදාළව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ලැයිස්තුගත කර ඇති කොළඹ දිස්ත්‍රික්කයේ අතුරුදහන් වූ සංඛ්‍යාව 5 දෙනෙකි. නාවික හමුදාව විසින් සිදුකරන ලද, බලහත්කාරී අතුරුදහන්වීම් පිළිබඳ වැදගත් සංකේතාත්මක සිද්ධිය වශයෙන් සැළකෙන ත්‍රිකුණාමලයේ 11 දෙනාගේ නාම ලේඛනය, මෙහිදී මඟහැරුණු අය අතර තිබීම මහත් කම්පනීය වේ. රජයේ වෙනත් ව්‍යුහයන්ට තමන් විසින් වාර්තා කළ තොරතුරු අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ස්වයංක්‍රීයව ලැබෙනු ඇතැයි උපකල්පනය කළ එක් ඥාතියෙක් සිය සමීපතමයාගේ නම ලැයිස්තුවට ඇතුළත්ව නැති බව පසක් කරගැනීමෙන් පසු ඉමහත් කම්පාව පළකර සිටියේය.

***කල් මැරීම?***

අතුරුදහන්වූවන්ගේ ඥාතීන් 73 දෙනකු 2017 සිට මේ දක්වා මියගොස් ඇති බව ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශයට පත්කිරීමට නියමිත ග්‍රන්ථයක්[10] විසින් දක්වා ඇති අතර අතුරුදහන්ව ඇති සිය සමීපතමයා පිළිබඳ තොරතුරක් ලැබෙන තුරු බලා සිටිමින් මියගිය සෑම මවක් හා පියකු ගැනම ජීවන සටහනක් එහි ඉදිරිපත් කෙරේ. මවක හෝ පියකු මියයන සෑම අවස්ථාවකම බලහත්කාරී අතුරුදහන්වීම් පිළිබඳ වටිනා සාක්ෂි මැකී යන බව එම කෘතිය විසින් පෙන්වා දෙයි.

*"විජයෝන්මාදය මොළවාලමින් මාතලේ සිට මුල්ලිවයික්කාල් දක්වා වන අපරාධකරුවන් කිසිදිනක වගඋත්තරදායක නොකොට පූර්ණ දණ්ඩ මුක්තිය ඇතිව උසස් තනතුරුවලට පත්කෙරෙද්දී යුක්තිය සඳහා තවදුරටත් බලාසිටීමට වින්දිතයන්ගේ පවුල්වලට නොහැකි"යැයි සූකා මහත්මිය ප්‍රකාශ කළාය. "ජවිපෙ නැගිටීම සැහැසි ලෙස මර්දනය කිරීමෙන් පසු දණ්ඩ මුක්තිය දිරිමත් කරමින් යුක්තිය සඳහා වූ ඉල්ලීම යටපත් කිරීමේ ප්‍රතිඵලය වූයේ තවත් සමූහ අපරාධයකි. ජීවිතය ගෙනයාමට නම් පවුල්වලට සමාප්තියක් ද, සමාජයට සත්‍යය ද අවශ්‍ය වේ."*

[9] "A large number of cases have also been reported in Colombo". https://www.hrw.org/report/2008/03/05/recurring-nightmare/state-responsibility-disappearances-and-abductions-sri-lanka

[10] THE DEPARTED: While searching for their Forcibly disappeared loved ones. Association for the Relatives of the Enforced Disappearances North & East Provinces.

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT